# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 50 දරන
# ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 දෙසැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි　　　　තැපැල් ගාස්තුව: ශත 60 යි

# 1983 අංක 50 දරන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 13 වන දින.]
එල්. ඩී.—ඕ. 26/81

**උසස් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන්ට ණය දීම සඳහාත්, 1972 අංක 4 දරන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල් පනත ඉවත් කිරීම සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 50 දරන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### ශිෂ්‍යයන්ට ණය දීම

2. (1) මෙහි පහත සඳහන් උසස් අධ්‍යාපන ආයතනවල, එනම්:— ණය දීම.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සැලකෙන සියලු විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල මණ්ඩප හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන සහ ඒවායේ යම් අනුප්‍රාප්තික ආයතනවල ; සහ

(ආ) උසස් අධ්‍යාපනය සපයන්නා වූ ද ආණ්ඩුවේ ප්‍රදාන මගින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ නඩත්තු කරනු ලබන හා මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද කවර හෝ ආයතනයක

ශිෂ්‍යයන්ට ණය දීම, මේ පනතේ විධිවිධානවලට යටත්ව, නිශ්චිතව නියම කෙරෙන බැංකුවක කාර්යය වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින්, කලින් කල, ලංකා බැංකුව හෝ මහජන බැංකුව හෝ මේ පනතේ කාර්ය සඳහා නිශ්චිත බැංකුවක් වශයෙන් නියම කරනු ලැබීමට කැමැත්ත දක්වන වෙනා යම් බැංකුවක් හෝ නිශ්චිතව නියම කළ හැකි ය. එසේ නිශ්චිතව නියම කරනු ලබන යම් බැංකුවක්, මේ පනතේ මින් මතු "නිශ්චිත බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) යම් වර්ෂයක දී ශිෂ්‍යයන්ට ණය දීම සඳහා කැමැත්ත දිය යුත්තේ නිශ්චිත බැංකු අතරෙන් කිනම් බැංකුව විසින් දැයි භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් එක් එක් නිශ්චිත බැංකුව විමසා, තීරණය කළ යුතු ය. එසේ තීරණය කරනු ලැබූ යම් නිශ්චිත බැංකුවක්, මෙහි මින් මතු "නියි නිශ්චිත බැංකුව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. (1) (අ) ණය දීම සඳහා ශිෂ්‍යයන් සුදුසු විය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි; ණය සඳහා සුදුසුකම් ඇති ශිෂ්‍යයන්ගේ ලැයිස්තුව පිළියෙල කිරීම.

(ආ) ණය දීම සඳහා සුදුසු ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තු පිළියෙල කිරීමේ දී ප්‍රධාන විධායක නිලධරයා විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

ඒ 073187—11,600 (83/10)

(ඈ) අමාත්‍යවරයාගේ මතය අනුව, ණය දීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් කරුණු,

සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින්, උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයාට, පොදු ලිඛිත විධාන නිකුත් කළ හැකි අතර, ඒ ලිඛිත විධානවලට අනුව කටයුතු කිරීම, ඒ ප්‍රධාන විධායක නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(2) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව මේ පනත යටතේ ණය ලැබීමට සුදුසුකම් ඇති ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තු, ඒ එක් එක් ශිෂ්‍යයා සඳහා නිර්දේශ කරන ණය මුදල් ප්‍රමාණය ද ඇතුළත්ව කලින් කල පිළියෙළ කර හෝ පිළියෙළ කරවා, ඒ ලැයිස්තු අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින්, නිශ්චිත බැංකුවල කළමනාකරුවන් විමසීමෙන් පසුව සහ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් දෙන ලද පොදු ලිඛිත විධාන ඇතොත් ඒවා සැලකිල්ලට ගනිමින්, (2) වන උපවගන්තිය යටතේ ඒ බලමණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති යම් ලැයිස්තු වෙතොත් ඒවා, අවශ්‍ය විය හැකි එකතු කිරීම්, කපා හැරීම් හෝ සුළු වෙනස් කිරීම් සහිතව අනුමත කර, ඒ ලැයිස්තු නිසි නිශ්චිත බැංකුවේ කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

නිසි නිශ්චිත බැංකුවක් විසින් ණය දිය හැක්කේ කවුරුන්හට ද යන වග හා ඒ පිළිබඳ නියමයන්.

4. (1) 3 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තමා වෙත එවන ලද ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තුවක් ලබන්නා වූ නිසි නිශ්චිත බැංකුවක කළමනාකරු විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව ඒ ශිෂ්‍යයන් අතරෙන් යමෙකුට හෝ ඒ ශිෂ්‍යයන් සියලු දෙනාට ම හෝ ණය දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ශිෂ්‍යයකුට දෙනු ලබන ණය මුදලක්, ඒ ණය මුදල ආපසු ගෙවීමට ඒ ශිෂ්‍යයාගේ පියා/මව හෝ භාරකරු විසින් නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් දෙන ලද ඇපවීමක් ද සහිතව, එය ආපසු ගෙවන බවට ඒ ශිෂ්‍යයා විසින් දෙන ලද ලිඛිත පොරොන්දුවක් මත දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත පොරොන්දුවට, නිසි නිශ්චිත බැංකුවට දෙන ලද පොරොන්දු නෝට්ටුවක් සහ නිසි නිශ්චිත බැංකුව වෙත ඉදිරිපත් කරන ණය ඉල්ලීම ද ඇතුළත් විය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් කොන්දේසි හැර, නිසි නිශ්චිත බැංකුව විසින් (1) වන උපවගන්තිය යටතේ ණය දිය හැක්කේ යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් හා කොන්දේසි ඒ බැංකුව විසින් තීරණය කළ යුතු ය.

**5.** මේ පනත යටතේ දෙන ලද යම් ණය වෙනුවෙන් අය කළ යුතු පොලී අනුපාතිකය, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, කලින් කල තීරණය කළ හැකි අතර ඒ පොලී අනුපාතිකය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයා විසින් නිසි නිශ්චිත බැංකුවට දැනුම් දිය යුතු ය. එසේ තීරණය කරන ලද පොලී අනුපාතිකය, මේ පනත යටතේ ණය දෙනු ලබන කාර්යය හා සමාන කාර්යයක් සඳහා යම් නිශ්චිත බැංකුවක් විසින් දෙනු ලබන ණය වෙනුවෙන් එවකට අයකරන පොලී අනුපාතිකයට වඩා අඩුවන අවස්ථාවක, ඒ පොලී අනුපාතික දෙක අතර වෙනස, අරමුදලින්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයා විසින් ඒ නිශ්චිත බැංකුවට වාර්ෂිකව ගෙවනු ලැබිය යුතු ය.

ශිෂ්‍යයන්ගෙන් අය කළ හැකි පොලිය.

**6.** උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් යම් ශිෂ්‍යයකුට ණය දීම ප්‍රතික්ෂේප කරන ලෙස හෝ බැංකුව විසින් යම් ණයක් කොටස් වශයෙන් දීම ආරම්භ කර ඇති අවස්ථාවක, ඒ ණයෙහි කොටස් තවදුරටත් දීම නතර කරන ලෙස හෝ යම් නිශ්චිත බැංකුවකට නියම කිරීම—

ණයක් දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අත් හිටුවීම.

(අ) ඒ ශිෂ්‍යයා ස්වකීය විභාගවල දී අසතුටුදායක ලෙස කටයුතු කර ඇත් නම්;

(ආ) ඒ ශිෂ්‍යයා අනිසි ලෙස හැසිරී ඇත් නම්; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, 3 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර ඒ ශිෂ්‍යයාගේ නම ඒ නිශ්චිත බැංකුව වෙත ඉදිරිපත් කරන ලද දිනයේ පටන් හෝ ණය දුන් දිනයේ පටන් ඒ ශිෂ්‍යයාගේ මූදල් තත්ත්වය දියුණුවී ඇත් නම්,

කරනු ලැබිය යුතු අතර, මේ නියමයට අනුකූලව කටයුතු කිරීම ඒ නිශ්චිත බැංකුවේ කාර්යය වන්නේ ය.

**7.** (1) 4 වන වගන්තිය යටතේ ශිෂ්‍යයකුට ණය මුදලක් දෙනු ලැබූ අවස්ථාවක, ඒ ණය දෙන ලද්දේ යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒවාට අනුකූලව ණය මුදල සහ ඒ මත අයවිය යුතු පොලිය ද නිසි නිශ්චිත බැංකුව විසින් අයකර ගත යුතු ය:

නිසි නිශ්චිත බැංකුවක් විසින් ණය හා පොලී අය කිරීම.

එසේ වුව ද ණය දුන් දිනයත් ඒ ණය ආපසු ගෙවීම ආරම්භ වන දිනයත් අතර කාලය සඳහා ඒ ණය වෙනුවෙන් අයවිය යුතු පොලිය ඒ බැංකුව විසින් දැනුම් දෙනු ලැබූ විට, ඒ පොලිය වශයෙන් අයවිය යුතු මුදල, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්, අරමුද ලින් ඒ බැංකුවට වාර්ෂිකව ගෙවනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "ආපසු ගෙවීම ආරම්භ වන දිනය" ශිෂ්‍යයා සේවානියුක්තිය ලබාගන්නා දින සිට මාස හතරක් ඇතුළත දිනයක් හෝ සිය පාඨමාලාව සම්පූර්ණ නොකොට උසස් අධ්‍යාපන ආයතනයෙන් අස්ව යන දින සිට මාස හතරක් ඇතුළත දිනයක් හෝ විය යුතු ය.

(2) නිසි නිශ්චිත බැංකුවට (1) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ යම් පොලියක් ලැබීම, ඒ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි ණය ලැබුම්කරුගෙන් හෝ ණය මුදලෙහි ඇප සහතික කරුගෙන් හෝ ඒ පොලිය අයකර ගැනීමෙන් වළක්වන්නක් ලෙස නොසැලකිය යුතු ය.

(3) ඒ පොලිය හෝ එහි යම් කොටසක් හෝ (2) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි ණය ලැබුම්කරුගෙන් හෝ ණය මුදලෙහි ඇප සහතික කරුගෙන් හෝ අයකර ගන්නා ලද අවස්ථාවක, එසේ අයකර ගන්නා ලද මුදලට සමාන මුදලක් බැංකුවේ කළමනාකරු විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු ය.

(4) මේ පනත යටතේ දෙන ලද යම් ණයක් වෙනුවෙන් යම් නිසි නිශ්චිත බැංකුවක් විසින් යම් මුදලක් අයකර ගන්නා ලද අවස්ථාවක, ඒ මුදල, (1) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ බැංකුව විසින් ලබන ලද පොලිය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ආපසු ගෙවීමට ඇති බැඳීම ඇවර කිරීම පිණිස පළමුකොට යෙදිය යුතු අතර, ඒ අනුව, ඒ බැංකුවේ කළමනාකරු විසින්, ඒ මුදල භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත යැවිය යුතු ය.

ණය ලැබුම් කරුවන්ගේ කාර්ය.

8. මේ පනත යටතේ නිසි නිශ්චිත බැංකුවකින් ලත් යම් ණය මුදලක ලැබුම්කරු විසින්, ඒ ණය මුදල වෙනුවෙන් යම්කිසි මුදලක් ඒ බැංකුවට තමාගෙන් අයවීමට ඉතිරිව ඇති තාක් කල්, ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින්, පහත සඳහන් තොරතුරු, මෙහි පහත නියමිත කාලසීමා ඇතුළත ඒ බැංකුවේ කළමනාකරු වෙත සැපයිය යුතු ය :—

(අ) තම වාසස්ථානයෙහි ලිපිනය හා ඒ ලිපිනයෙහි කලින් කල යම් වෙනසක් සිදු වුවහොත්, ඒ වෙනස සිදුවී මාසයක් ඇතුළත ;

(ආ) තමාගේ නම වෙනස් කළ අවස්ථාවක, තම අලුත් නම සහ ඒ වෙනස කළ දිනය හා ආකාරය, ඒ වෙනස සිදු කළ දින සිට මාසයක් ඇතුළත ;

(ඇ) තමා යම් සේවා නියුක්තියක යෙදුණු අවස්ථාවක, ඒ සේවා නියුක්තිය ආරම්භ කළ දින සිට මාසයක් ඇතුළත ඒ සේවා නියුක්තියේ ස්වභාවය, සේවා යෝජකයාගේ නම සහ ලිපිනය, සේවා නියුක්තිය ආරම්භ කළ දිනය හා ඒ සඳහා ගෙවනු ලබන පාරිශ්‍රමිකය සහ කලින් කල සේවා නියුක්තියෙහි සිදු විය හැකි වෙනස්වීම් පිළිබඳ තොරතුරු එපරිද්දෙන්ම ;

(ඈ) ණය මුදල ආපසු අයකර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍යයයි ඒ කළමනාකරු විසින් සැලකිය හැකි වෙනත් යම් තොරතුරක් ඒ ණය මුදල ලැබුම්කරුගෙන් ඒ තොරතුරු ඉල්ලා කළමනාකරු එවන දැන්වීමක නිශ්චිතව සඳහන් කර තිබිය හැකි කාලයක් ඇතුළත.

මේ පනත යටතේ ණයක් ලැබුම් කරුවකුගේ සේවා යෝජකයාගේ කාර්යය.

9. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට මාස තුනක් ඇතුළත, සෑම සේවායෝජකයකු විසින්ම, 1969 ඔක්තෝබර් මස 01 වන දින දී හෝ ඉන් පසුව තමා යටතේ සේවා නියුක්තිය ලබාගෙන ඇති එක් එක් සේවා නියුක්තයාට, උසස් අධ්‍යාපන කාර්ය සඳහා ඔහු යම් බැංකු ණය මුදලක් ලැබුවේද නැද්ද යන වග විමසමින් හා එසේ ණය මුදලක් ලබා ඇත්නම්, ඒ ණය පිළිබඳ විස්තර, සේවා යෝජකයාටත් ඒ ණය ලබා ගන්නා ලද්දේ යම් බැංකුවකින් ද ඒ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාටත් සපයන ලෙස නියම කරමින් දැන්වීමක් සංසරණය කළ යුතු ය. තවද ඒ දැන්වීම ලැබී දවස් දහහතරක් ඇතුළත, එකී තොරතුරු සැපයීම ඒ එක් එක් සේවා නියුක්තයාගේ කාර්යය විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ විට, සෑම සේවා යෝජකයකු විසින්ම, තමා යටතේ සේවා නියුක්තිය සඳහා තෝරාගනු ලැබූ කවර හෝ තැනැත්තකුට පත්වීමේ ලිපියක් නිකුත් කිරීමට පෙර, උසස් අධ්‍යාපන කාර්ය සඳහා ඒ තැනැත්තා යම් බැංකු ණය මුදලක් ලැබුවේ ද නැද්ද යන වග ප්‍රකාශ කරන ලෙස සහ, එසේ ණය මුදලක් ලබා ඇති නම් ඒ ණය පිළිබඳ විස්තර සේවා යෝජකයාටත් ඒ ණය ලබා ගන්නා ලද්දේ යම් බැංකුවකින් ද ඒ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාටත් සපයන ලෙස ලියාපදිංචි කළ තැපෑලෙන් යවන දැන්වීමක් මගින් නියම කළ යුතු ය. ඒ දැන්වීම තමා වෙත ලැබී දවස් තිහක් ඇතුළත ඒ තොරතුරු සැපයීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය. එකී දවස් තිහක කාලසීමාව ඇතුළත ඒ තොරතුරු සැපයීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ තැනැත්තාට, සේවා යෝජකයා විසින් පත්වීමේ ලිපියක් නිකුත් නොකළ යුතු ය.

(3) යම් සේවා නියුක්තයකුගෙන් (1) වන උපවගන්තිය යටතේ යම් තොරතුරු ලැබී හෝ සේවා නියුක්තිය සඳහා තෝරා ගනු ලැබූ යම් තැනැත්තකුගෙන් (2) වන උපවගන්තිය යටතේ යම් තොරතුරු ලැබී දවස් දහ හතරක් ඇතුළත, සේවා යෝජකයා විසින් ඒ තොරතුරු අදාළ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට දැන්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට හෝ යම් සේවා නියුක්තයකු මේ පනත යටතේ බැංකුවෙන් ණය මුදලක් ලබාගත්තකු බව විශ්වාස කිරීමට නිශ්චිත බැංකුවකට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඒ සේවා නියුක්තයාගේ වැටුපෙන් යම් නිශ්චිත මුදලක් එක්වර හෝ කොටස් වශයෙන් හෝ අයකර ගත යුතු බවට ඒ නිශ්චිත බැංකුව විසින් ඒ සේවා යෝජකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවිය යුතු අතර වෙනත් යම් ලිඛිත නීතියක හෝ තමා හා සේවා නියුක්තයා අතර පවත්නා යම් ගිවිසුමක හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ඒ නොතකා ඒ මුදල හෝ මුදල් ප්‍රමාණයන්, ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව අයකර ගෙන ඒ මුදල හෝ මුදල් ප්‍රමාණයන් ඒ බැංකුවේ කළමනාකරු වෙත යැවීම සේවා යෝජකයාගේ කාර්යය විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ හෝ අසත්‍ය නැතහොත් සදොස් තොරතුරු සපයන්නා වූ යම් සේවා යෝජක යකු, සේවා නියුක්තයකු හෝ සේවා නියුක්තිය සඳහා තෝරා ගනු ලැබූ තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(6) 8 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නැතහොත් (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ හෝ යම් ලිපියක් හෝ දැන්වීමක් ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලැබූ අවස්ථාවක, ඒ ලිපිය හෝ දැන්වීම තැපැල් කළ දින සිට දින හතක් ඇතුළත එය ලිපි හිමියා විසින් ලබන ලද සේ සැලකිය යුතු ය.

හිඟ ණය මුදල් අයකර ගැනීම සඳහා ව්‍යංජිත කැමැත්ත.

**10.** මේ පනත යටතේ නිශ්චිත බැංකුවකින් ලත් ණය මුදලක ලැබුම්කරුවකුව සිටින්නාවූ ද ඒ ණය මුදල සම්බන්ධයෙන් යම් මුදලකට ඒ බැංකුවට ණයගැතිව හෝ බැඳී සිටින්නා වූ ද කවර හෝ සේවා නියුක්තියක යෙදී සිටින්නා වූ ද යම් තැනැත්තකු, ඔහු හා ඔහුගේ සේවා යෝජකයා අතර පවතින යම් ගිවිසුමක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව ඇති කිසිවක් හෝ නොතකා, ඒ සේවා නියුක්තියෙන් ඔහුට ලැබෙන පාරිශ්‍රමිකයෙන්, 9 වන වගන්තියේ (4) වන උපවගන්තියේ දක්වා ඇති ආකාර යට එකී මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා සිය කැමැත්ත දී ඇති ලෙස සැලකිය යුතු ය.

බාලවයස්කරුවන්ගෙන් මුදල් අය කර ගැනීම.

**11.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද යම් නිශ්චිත බැංකුවකින්, වයස අවුරුදු විසි එකට අඩු යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ ලබන ලද හෝ ඔහු ඇප වූ යම් ණයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ඇතුළත් වූ යම් එකඟවීමක් හෝ ගිවිසුමක් වලංගු ලෙස ඇති කරගනු ලැබූ සේ සැලකිය යුතු අතර ඒ අනුව ඒ එකඟවීම හෝ ගිවිසුම ඇති කර ගන්නා ලද අවස්ථාවෙහි ඔහු වයසින් අවුරුදු විසි එක ඉක්මවා සිටියකු සේ ඔහුට විරුද්ධව එය ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය.

ණය මුදල් ඇප සහතිකකරුගෙන් අය කර ගැනීම.

**12.** ණය මුදලක් ලැබූවකු 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එය ආපසු ගෙවීම පැහැර හැරි අවස්ථාවක, නිශ්චිත බැංකුවක් විසින්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ඒ ණයෙහි ඇප සහතික කරුගෙන් ඒ ණය මුදල අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

නිශ්චිත බැංකුව ප්‍රධාන ණයහිමියා ලෙස සැලකිය යුතු බව.

**13.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ පට හැනිව කුමක් සඳහන්ව තිබුණ ද ණය මුදලක් දෙන නිශ්චිත බැංකුවක්, ඒ ණය මුදල සම්බන්ධයෙන් ප්‍රධාන ණයහිමියා ලෙස සැලකිය යුතු ය.

ණය ලැබුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටවී යාම සීමා කිරීම.

14. (1) නිශ්චිත බැංකුවකින් මේ පනත යටතේ දෙන ලද යම් ණය මුදලක ලැබුම්කරු වන කිසිම තැනැත්තකු, තමාගෙන් ඒ ණය මුදල වෙනුවෙන් යම් මුදලක් එකී බැංකුවට අය විමට ඇති තාක් කල්, ශ්‍රී ලංකාවෙන් පිටවී නොයා යුතු ය :

එසේ වුවද ඒ බැංකුව සෑහීමට පත්වන පරිදි එකී ණය ලැබුම්කරු විසින් සතුටුදායක හා ප්‍රමාණවත් ඇපයක් සපයා ඇති බවට ඒ නිශ්චිත බැංකුවේ කළමනාකරු සෑහීමට පත්වන්නේ නම්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ තැනැත්තා ඒ සීමා කිරීමෙන් නිදහස් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, ඔහු මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, ශ්‍රී ලංකාවෙන් පිටවී යන තැනැත්තන්ට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අතිරේකව මිස, ඒවායේ බලහීන කිරීම් වශයෙන් නොවිය යුතු ය.

ණය මුදලක් ලැබුම්කරු හෝ ණය මුදලක ඇප සහතිකකරු ඇතැම් ප්‍රඥප්තිවල වාසිය නොඅයැදිය යුතු බව.

15. (1) මේ පනත යටතේ වූ ණය මුදලක් හෝ ණය මුදලක යම් කොටසක් හෝ ඒ සඳහා අයවිය යුතු යම් පොලියක් හෝ අය කර ගැනීම සඳහා යම් අධිකරණයක් ඉදිරියේ ඇති යම් නඩුවක දී, කාරණයක දී හෝ නීති කෘත්‍යයක දී පහත සඳහන් ප්‍රඥප්තිවල විධිවිධාන අතරෙන් යම් කිසිවක වාසිය අයැද සිටීමට, ඒ ණය මුදල ලැබුම්කරුට හෝ ඒ ණය මුදලේ ඇප සහතිකකරුට අවකාශ නොලැබිය යුතු ය :—

(අ) කාලසීමා ආඥපනත (68 වන අධිකාරය)

(ආ) ණය බේරීමේ ආඥපනත (81 වන අධිකාරය)

(ඇ) වස්තු භංගත්ව ආඥපනත (97 වන අධිකාරය)

(ඈ) සිවිල් නඩු විධාන සංග්‍රහය (101 වන අධිකාරය)

(ඉ) රජයේ සේවක (බැඳීම්) ආඥපනත (103 වන අධිකාරය)

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, මේ පනත යටතේ යම් ණය මුදලක් දීමේ දී කොන්දේසියක් ලෙස සැලකිය යුතු ය.

(3) මේ පනත යටතේ වූ යම් ණය මුදලක ඇප සහතිකකරුට, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඇපකරුවකු සඳහා ඇති වාසි හෝ වරප්‍රසාද සඳහා අයැද සිටීමේ හිමිකමක් නොමැති විය යුතු අතර ණය මුදල ආපසු ගෙවීම සඳහා ණය ලැබුම්කරු ද සමග එක්ව සහ වෙන් වෙන්ව බැඳී සිටින සේ සැලකිය යුතු ය.

## II වන කොටස

### අරමුදල ක්‍රියාත්මක වන ආකාරය

ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල පිහිටුවීම.

16. (1) ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල යන නමින් හැඳින්වෙන අරමුදලක් භාණ්ඩාගාරයෙහි පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල සඳහා පොදු ගිණුමක්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විධාන කරන ආකාරයට, භාණ්ඩාගාරයෙහි විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

අය කරගත නොහැකි ණය.

17. (1) මේ පනත යටතේ දෙන ලද යම් ණය මුදලක් වෙනුවෙන් යම් නිශ්චිත බැංකුවකට අයවිය යුතු කිසියම් මුදලක්, ආපසු අය කර ගත නොහැකි බව ඒ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලියවිල්ලක් මඟින්, ඒ ලියවිල්ලේ නිශ්චිතව සඳහන් මුදල ආපසු අයකර ගත නොහැකි බව, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට දැනුම් දිය යුතු ය. ඒ දැන්වීම ලැබුණු විට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්, ඒ මුදල අරමුදලින් හෝ ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රභවයකින් හෝ ඒ නිශ්චිත බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට ගෙවිය යුතු ය.

(2) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් කරනු ලැබූ එවැනි යම් ගෙවීමකින්, නිසි නීති ක්‍රියාවලියකට අනුකූලව, ඒ මුදල අයකර ගැනීමට ඒ බැංකුවට ඇති අයිතිවාසිකමට හානියක් නොවිය යුතු ය:

එසේ වුව ද ඒ මුදල හෝ ඉන් යම් කොටසක් හෝ බැංකුව විසින් එසේ ආපසු අය කර ගනු ලැබූ අවස්ථාවක, එසේ අය කර ගනු ලැබූ මුදලට සමාන මුදල් ප්‍රමාණයක් බැංකුවේ කළමනාකරු විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු ය.

අරමුදලට ගෙවිය යුතු මුදල්.

18. පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන සියලුම මුදල්, අරමුදලට ගෙවිය යුතු ය.

අරමුදලින් ගෙවිය යුතු මුදල්.

19. අරමුදලේ බැරට ඇති මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වියපැහැදම් කළ හැකිය.

## III වන කොටස

### සාමාන්‍ය කරුණු

නිලධරයන්, සේවකයන් ආදීන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකෙන බව.

20. යම් උසස් අධ්‍යාපන ආයතනයක හෝ යම් නිශ්චිත බැංකුවක හෝ මේ පනතේ විධිවිධාන ප්‍රකාර යම් කාර්යයක් පවරනු ලැබ ඇති ණය ලැබුම්කරුවකු සේවා නියුක්තයකුව සිටින යම් ආයතනයක හෝ සෑම නිලධරයකුම හෝ වෙනත් සේවකයකුම, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය සේවකයකු ලෙස සැලකිය යුතුය.

21. (අ) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තු පිළියෙල කිරීම හා සම්බන්ධව යම් උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකු හෝ ඔහුගේ පියා/මව නැතහොත් භාරකරු විසින් ඒ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාට යම් අසත්‍ය තොරතුරක් දී ඇති අවස්ථාවක ; වැරදි හා දඬුවම්.

(ආ) යම් ණය මුදලක් ලැබුම්කරු හෝ ඔහුගේ පියා/මව නැතහොත් භාරකරු හෝ ඇප සහතිකකරු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ, මේ පනත යටතේ දෙන ලද හෝ දීමට ඇති ණය මුදලක් හා සම්බන්ධයෙන්, නිශ්චිත බැංකුවක කළමනාකරුට අසත්‍ය තොරතුරක් දී ඇති අවස්ථාවක ; හෝ

(ඇ) යම් ණය මුදලක් ලැබුම්කරුවකු 8 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම ඕනෑකමකින්ම පැහැර හරින නැතහොත් එසේ ක්‍රියා කිරීමේ දී ප්‍රස්තුත නිශ්චිත බැංකුවෙහි කළමනාකරුට අසත්‍ය තොරතුරක් දෙන අවස්ථාවක

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් කර ඇති ලෙස සැලකිය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

22. (1) 1972 අංක 4 දරන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල් පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම සහ අත් හැරීම.

(2) ඉහත සඳහන් පනත ඉවත් කරනු ලැබුවද—

(අ) ඒ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදලේ බැරට ඇති සියලුම මුදල්, මේ පනත යටතේ පිහිටුවන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදලට මාරු කළ යුතු ය;

(ආ) ඒ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදලේ සියලු වත්කම් හා බැරකම් මේ පනත යටතේ පිහිටුවන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදලේ වත්කම් හා බැරකම් ලෙස සැලකිය යුතු ය ;

(ඇ) ඒ පනත යටතේ දෙන ලද ණය මුදල් ආපසු අය කර ගැනීම සඳහා වූ අවසන් නොවී පවත්නා සියලු නඩු සහ නීති කෘත්‍ය මේ පනත යටතේ වූ නඩු හා නීති කෘත්‍ය ලෙස සැලකිය යුතු අතර ඒවා මේ පනත යටතේ දිගටම පවත්වාගෙන ගොස් අවසන් කළ යුතු ය.

1972 අංක 4 දරන පනත යටතේ දෙන ලද ණය ආපසු අයකර ගැනීම.

23. 1972 අංක 4 දරන ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල් පනත මගින් පිහිටුවන ලද ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදලෙන් දෙන ලද යම් ණයකින් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේ සිට සහ ඉන් පසුව යම් නිශ්චිත බැංකුවක් විසින් යම් මුදලක් ආපසු අය කර ගන්නා ලද අවස්ථාවක, ඒ මුදල, ඒ නිශ්චිත බැංකුව විසින්, මේ පනත යටතේ පිහිටුවා ඇති අරමුදලට බැර කළ යුතු ය.

අර්ථ නිරූපණය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සේවා යෝජකයා" යන්නෙන්, රාජ්‍ය සේවයෙහි, පළාත් පාලන සේවයෙහි, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා හෝ රාජ්‍ය සංස්ථාවේ නැතහොත් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා අදහස්වන අතර, වෙනත් යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් වන විට, ඒ සේවා නියුක්තයා සේවයේ නියුක්ත කරනු ලැබ සිටින සාප්පුවේ, කාර්යාලයේ හෝ ආයතනයේ අයිතිකරු, කළමනාකරු හෝ පරිපාලක අදහස් වේ ;

"සේවා නියුක්තිය" යන්නෙන්, යම් වැටුපක්, දීමනාවක්, පාරිශ්‍රමිකයක් හෝ වෙනත් ආදායමක් ලැබෙන යම් සේවා නියුක්තියක් අදහස් වන අතර ස්වයං රැකියාවක් ද ඊට ඇතුළත් වේ ;

"අරමුදල" යන්නෙන්, මේ පනතේ 16 වන වගන්තියෙන් පිහිටුවනු ලැබූ ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල අදහස් වේ ;

"පාලක බලමණ්ඩලය" යන්නෙන්—

(අ) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ ;

(ආ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ කළමනාකාර මණ්ඩලය අදහස් වේ ; තවද

(ඇ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වෙනත් යම් ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්—

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සැලකෙන විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයක මණ්ඩප හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සහ ඒ විශ්වවිද්‍යාලයක, මණ්ඩපයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක අනුප්‍රාප්තික ආයතනයක් ; සහ

(ආ) උසස් අධ්‍යාපනය සපයන්නාවූ ද ආණ්ඩුවේ ප්‍රදාන මගින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ නඩත්තු කරනු ලබන හා මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවාවූ ද කවර හෝ ආයතනයක්

අදහස් වේ;

"කළමනාකරු" යන්නට, යම් නිශ්චිත බැංකුවක් සම්බන්ධයෙන් වූ විට, ඒ බැංකුවේ යම් ශාඛාවක කළමනාකරු ද ඇතුළත් වේ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්—

(අ) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට ඒ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ;

(ආ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා අදහස් වේ;

(ඇ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වෙනත් යම් ආයතනයක් සම්බන්ධයෙන් වූ විට ඒ ආයතනයේ ප්‍රධානයා අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.